ප්‍රවෘත්ති නිවේදනය
**PRESS RELEASE**
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு அத்துடன் பெண்கள் மற்றும் சிறுவர் மற்றும் சமுக பாதுகாப்பு
Ministry of Women & Child Affairs, Social Security, Health & Indigenous Medicine Services
Telephone office: 2693919 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2020.02.19**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**නව කොරෝනා වෛරසය ආසාදිතව අංගොඩ බෝවන රෝග විද්‍යායතනයෙන් ප්‍රතිකාර ලබාගත් චීන ජාතික කාන්තාව සම්පූර්ණයෙන් සුවය ලබා රෝහලෙන් පිටව යයි.**

**"ලෝකයේ ශක්තිමත්ම සුව සේවාවක් අප රට සතු වීමෙන් ප්‍රතිකාර සේවාවන් සහ රෝගය පැතිරීම පාලනය කළ හැකි වුණා. වෛරසය රටට පැමිණීම වැළැක්වීමට සෞඛ්‍ය අංශ තවත් ශක්තිමත් කරනවා." සෞඛ්‍ය අමාත්‍යවරිය පවසයි.**

නව කොරෝනා වෛසරය ආසාදිතව 2020 ජනවාරි මස 25 දින අංගොඩ ජාතික බෝවන රෝග විද්‍යායතනයට ඇතුලත් කළ චීන ජාතික Luo Yan (වයස අවුරුදු 43) කාන්තාව සම්පූර්ණ වශයෙන් සුවය ලබා ඇති බවට වෛද්‍ය වාර්තා සහ වෛද්‍යවරු නිගමනය කිරීමෙන් පසු අද දින (19) රෝහලෙන් මුදා හැරීමට කටයුතු යෙදිනි.

මෙම අවස්ථාවට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ද එක් විය. සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් චීන ජාතික Luo Yan මහත්මිය මල් කළඹක් දී සිප වැළඳ ගැනීමින් පිළිගැනීම විශේෂත්වයක් ද විය. අනතුරුව රෝහලේ බුදු මැදුර වෙත ගොස් ආගමික කටයුතු ද සිදු කිරිමට ද රෝහල් කාර්ය මණ්ඩලය අවස්ථාව සළසා තිබුනි.

නව කොරෝනා වෛසරය ආසාදිත සහ ආසාදිත බවට සැකකරන රෝගීන් වැඩිම ප්‍රමාණයක් ප්‍රතිකාර ගනු ලැබුයේ අංගොඩ ජාතික බෝවන රෝග විද්‍යායතනයෙනි. එම පිරිස 128 කි. ඒ අතර ශ්‍රී ලාංකිකයින් 79 ක් චීන ජාතිකයින් 32 ක් සහ අනෙක් පිරිස විදේශිකයින් වූ බව රෝහල් අධ්‍යක්ෂවරයා පවසයි.

මෙහිදී මාධ්‍ය වෙත අදහස් දැක් වූ සෞඛ්‍ය අමාත්‍යවරිය - මේ රටට නව කොරෝනා වෛරසය ආසාදනය වෙලා පැමිණි රෝගියාව මේ රටේ කිසිම කෙනෙකුට නැවැත ඒ රෝගය බෝවන තත්ත්වයෙන් වළක්වලා ඒ රෝගියාවත් සුවපත් කරලා නැවැත සිය රටට යැමට එම මහත්මියට හැකිවන පරිදි අපිට කටයුතු කරන්න පුළුවන් වීම ගැන සෞඛ්‍ය අමාත්‍යාංශය විදිහට, රටක් විදිහට අපි බොහෝම සතුටු වෙනවා. විශේෂයන්ම මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන. මේ රෝගය ලොව පුරා පැතිරෙන බව දැනගත් වහාම ජාතික කාර්ය සාධක බලකායක් හදන්න කියලා මට උපදෙස් දීලා අවශ්‍ය සියළුම අමාත්‍යාංශවල නිලධාරින් සහ වෛද්‍යවරුන් ඒ කාර්ය සාධක බලකායට ඇතුලත් කරලා, මේ රෝගය පැතිරීම වැළැක්වීමට එතුමා අපට ලබාදුන් උපදෙස් එමෙන්ම ඒ කාර්යසාධක බලකාය කැදවලා උපදෙස් ලබාදීම පිළිබදව ගරු අගමැතිතුමාට අපි අපේ ගෞරවය පුද කරන්නට ඕනි. රජයක් විදිහට ඒ නිවැරදි නායකත්වයන් නිසා පළමුව මේ රට මේ උවදුරින් ගලවා ගැනීමට හැකි වුණා.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විදිහට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මැතිතුමා මේ සම්බන්ධයෙන් සියළුම තාක්ෂණික කණ්ඩායම් කැදවලා මේ රෝගය රට තුල පැතිරීම වැළැක්වීම සඳහා ගත හැකි සියළු ක්‍රියාමාර්ග දිනපතා සාකච්ඡා පවත්වා ගැනීම තුල මේ රෝගය රට තුල පැතිරිම වැළැක්වීමට අපට හැකි වුණා. එමෙන්ම මෙම රෝහලේ අධ්‍යක්ෂ

වෛද්‍ය හසිත අත්තනායක මැතිතුමා මේ රෝහල ක්‍රමවත්ව පවත්වාගෙන යමින් ඒ කළමණාකරණය සිදු කිරීම ගැන අපි ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන් මෙහි ප්‍රධානම ගෞරවය ලබාදිය යුත්තේ කායික රෝග විශේෂඥ වෛද්‍ය එරංග නාරම්ගොඩ මහතාට. එතුමාගේ නායකත්වයෙන් තමයි මෙම රෝගියාව කළමණාකරණය සහ රෝගය පැතිරීම පාලනයට ක්‍රියා කළේ. එම අංශයේ සිටින විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහතාට ද අපේ ගෞරවය පුද කරනවා. ප්‍රතිකාර සේවාවන් සඳහා සම්බන්ධ වූ සියලුම හෙද, වෛද්‍යවරු ඇතුලු සියලු රෝහල් කාර්ය මණ්ඩලවලට සහ මේ සඳහා උදව් උපකාර කළ විශේෂඥ වෛද්‍යවරුන්ටත් සෞඛ්‍ය අමාත්‍යවරිය විදිහට මගේ ගෞරවය පුද කරනවා. ඔවුන් රෝගය පැතිරිම වැළැක්වීම සඳහා ගත් සියළු ක්‍රියාමාර්ග වලටත් අපි ස්තූතිය පුද කරනවා. රජයක් විදිහට අපි ඉදිරියටත් මේ රෝගය ලංකාවට පැමිණීම වැළැක්වීමට අපි ගත් සියලු ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කරමින් ඒ සම්බන්ධයෙන් නිතිපතා ඇගයීමට ලක් කරමින්, ඒ සඳහා අවශ්‍ය කණ්ඩායම් කැඳවමින් රජයක් විදිහට සියලු පියවර ගැනීමට මුලදී ගත් උත්සාහයම, මැදිහත්වීමම තවදුරටත් ශක්තිමත් කරමින් කටයුතු කරනවා. ලෝකයේ තිබෙන ශක්තිමත්ම සෞඛ්‍ය සේවයක් අප රටට තිබෙන්නේ. එම ශක්තිමත් සෞඛ්‍ය සේවය මේ කටයුත්තේ දී අපට විශාල උපකාරයක් වුණා.

මෙම අවස්ථාවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, අංගොඩ ජාතික බෝවන රෝග විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය හසිත අත්තනායක මහතා, කායික රෝග විශේෂඥ වෛද්‍ය එරංග නාරම්ගොඩ මහතා ඇතුලු රෝහලේ විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍යවරු, හෙද හෙදියන් ඇතුලු සෞඛ්‍ය කාර්ය මණ්ඩල එක්ව සිටියහ.

විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය






